# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා - 2024

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් 2024 අධ්‍යයන වර්ෂයේ දී පැවැත්වීමට නියමිත පහත සඳහන් සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් 2024.04.08 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. ලියාපදිංචිය සඳහා එක් කාණ්ඩයකින් එක් පාඨමාලාව බැගින් තෝරාගත හැකිය. පාඨමාලා දෙකකට ඉල්ලුම් කරන්නේ නම් ඒවාට වෙන වෙනම ඉල්ලුම්පත් යොමු කළ යුතු ය. **පාඨමාලා දේශන භෞතික/මාර්ගගත ක්‍රමයට පැවැත්වේ.** (අවශ්‍ය අවම ඉල්ලුම්පත් ප්‍රමාණයට යටත්ව) මෙම පාඨමාලා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

## බුද්ධධර්ම/පාලි/සංස්කෘත - ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා - 2024

(I කාණ්ඩය)

(උසස් ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීමෙන් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය හැදෑරීමට සුදුසුකමක් වේ.)

**ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් :**

**බුද්ධධර්ම/පාලි/සංස්කෘත - ඩිප්ලෝමා පාඨමාලාව : (SLQF Level 03-30 Credits)**

❖ අ.පො.ස. (සා/පෙළ) හෝ මූලික පිරිවෙන් අවසාන විභාගය අවම වශයෙන් විෂයයන් 06කින් සමත්වීම.

හෝ

❖ ධර්මාචාර්ය විභාගය සම්පූර්ණ කර තිබීම.

හෝ

❖ ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උ/පෙළ) සමත් ව තිබීම.

**බුද්ධධර්ම/පාලි/සංස්කෘත උසස් ඩිප්ලෝමා පාඨමාලාව (SLQF Level 04-30 Credits)**

❖ මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන බුද්ධධර්ම/පාලි/සංස්කෘත ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් ව තිබීම

හෝ

❖ බුද්ධධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය/පාලි/සංස්කෘත ඇතුළුව අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්ව තිබීම

හෝ

❖ බුද්ධධර්ම/පාලි/සංස්කෘත යන විෂයයන් සහිත ව අ.පො.ස. (සා/පෙළ) හෝ මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් ව තිබීම හා ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උ/පෙළ) සමත් ව තිබීම.

## ජපන්/කොරියන්/චීන/හින්දි/ප්‍රංශ භාෂා සහතිකපත්‍ර/උසස් සහතිකපත්‍ර/ඩිප්ලෝමා - 2024

(II කාණ්ඩය)

**ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් :**

**ජපන්/කොරියන්/චීන/හින්දි/ප්‍රංශ භාෂා සහතිකපත්‍ර පාඨමාලාව**

- වයස අවුරුදු 16 සම්පූර්ණ කළ ජපන්/කොරියන්/චීන/හින්දි/ප්‍රංශ භාෂා ඉගෙනීමට උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට අයදුම් කළ හැකිය.

### ජපන්/කොරියන්/චීන/හින්දි/ප්‍රංශ භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව

- අ.පො.ස. සා/පෙළ විභාගය විෂයයන් හයකින් (06) සමත් වීම සහ මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් සමත්වීම.

### ජපන්/කොරියන් භාෂා ඩිප්ලෝමා පාඨමාලාව SLQF Level 3-30 Credits

- අ.පො.ස. සා/පෙළ විභාගය ජපන්/කොරියන් භාෂාව ඇතුළුව සමත්වීම සහ මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් 70% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා සමත්වීම.

---

### උසස් සහතිකපත්‍ර හා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය:

අයදුම්පත් භාරගෙන අවසන් වීමෙන් පසු විශ්වවිද්‍යාලය විසින් දැනුම්දෙනු ලබන සති අන්ත දිනකදී කොළඹ 07, අංක 214, බෞද්ධාලෝක මාවත, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී දක්වන කුසලතාව මත සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

---

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල / ඉංග්‍රීසි

**පාඨමාලා කාලය** : සෑම පාඨමාලාවක ම කාලය වසර එකකි. (සියලු පාඨමාලා 2024.05.04 දින සිට ආරම්භ කිරීමට නියමිතය.)

---

**ගාස්තු :**

| | | |
|---|---|---|
| සහතිකපත්‍ර පාඨමාලා | : | රු. 20,000/- |
| උසස් සහතිකපත්‍ර පාඨමාලා | : | රු. 25,000/- |
| ඩිප්ලෝමා පාඨමාලා | : | රු. 31,000/- |
| උසස් ඩිප්ලෝමා පාඨමාලා | : | රු.36,000/- |

(සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් සඳහා පාඨමාලා ගාස්තු වාරික 02 කින් ගෙවිය හැක. එසේ ගෙවනු ලැබූ කිසිදු මුදලක් ආපසු අයදුම්කරුවන්ට නොගෙවන බව කරුණාවෙන් සලකන්න.)

---

### අයදුම්පත් ලබා ගත හැකි ආකාරය :

පාඨමාලා පිළිබඳ විස්තර හා අයදුම්පත් පැමිණ ලබා ගන්නේ නම්, 2024.04.03 දින දක්වා සතියේ වැඩ කරන දිනවල ප.ව. 3.00ට පෙර අංක. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ සරප් වෙත මුදල් ගෙවා හෝ දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 711202 දරන ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ය.

තැපැල් මගින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, ඉහත ඡේදයේ පරිදි රු. 500/-ක අයදුම්පත් ගාස්තුව ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9X4 ප්‍රමාණයේ, රු. 50/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකි ය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නො ලැබේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර - **"අයදුම් පත්‍ර ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

විශ්වවිද්‍යාලයේ www.bpu.ac.lk යන වෙබ් අඩවිය මඟින් ද අයදුම්පත් ලබා ගත හැකිය. වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම්පත් භාරදීමේදී රු. 500/-ක අයදුම්පත් ගාස්තුව ගෙවූ බැංකු රිසිට්පත සම්පූර්ණ කළ අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

**සැ.යු. : බැංකුවට අයදුම්පත් ගාස්තු ගෙවීමේ දී, I කාණ්ඩයෙහි පාඨමාලාවක් නම් "B/Dip" ලෙසද, II කාණ්ඩයෙහි පාඨමාලාවක් නම් "Other" ලෙසද ලදුපතෙහි තැන්පත්කරුගේ නම ඉදිරියෙන් සටහන් කළ යුතුය.**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2024.04.08 වේ. **නිසියාකාර ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් ඉහත ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන පාඨමාලාවේ නම "බුද්ධධර්ම/පාලි/සංස්කෘත/ ජපන්/කොරියන්/ප්‍රංශ/චීන/හින්දි සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

වැඩි විස්තර සඳහා: 011-2580609/011-2502944/011-2593604
පාඨමාලා සමායෝජක බුද්ධධර්ම : 0715829155
පාඨමාලා සමායෝජක භාෂා පාඨමාලා : 071 2433662

**නියෝජ්‍ය ලේඛකාධිකාරී (ලේඛකාධිකාරී වැඩබලන)
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**
2024.03.06